# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2090/11 - 2018 සැප්තැම්බර් මස 25 වැනි අඟහරුවාදා - 2018.09.25

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 4/81 (VI)

**1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත**

24 ඇ සහ 24 ඇ වගන්ති යටතේ වූ නියමය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට කරන ලද දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ 51 වන වගන්තිය සමඟ කියවිය යුතු 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනතේ 24 ඇ වගන්ති මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මා විසින් මේ නියමය මගින් ''මුතුරාජවෙල පාරිසරික ආරක්ෂක ප්‍රදේශය'' යනුවෙන් හඳුන්වනු ලබන පාරිසරික ආරක්ෂක ප්‍රදේශය ප්‍රකාශයට පත් කරමින් ඉහත කී පනතේ 24 ඇ සහ 24 ඇ වගන්ති යටතේ සාදන ලද සහ 2006 ඔක්තෝබර් මස 13 වන දින අංක 1466/26 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමය, එකී නියමයේ -

(*අ*) (ඇ) වන පරිච්ඡේදයේ ''2006 සැප්තැම්බර් මස 15 වන'' යන වචන හා ඉලක්කම් වෙනුවට ''2004 සැප්තැම්බර් මස 15 වන'' යන වචන හා ඉලක්කම් ආදේශ කිරීම මගින් ; සහ

(*ආ*) I වන උපලේඛනය වෙනුවට පහත උපලේඛනය ආදේශ කිරීමෙන්,

**'' I වන උපලේඛනය**

***මුතුරාජවෙල පාරිසරික ආරක්ෂක ප්‍රදේශයේ සීමා***

වත්තල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ පට්ටියවෙල ගමේ රාගම් පත්තුවේ බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ පිහිටි මුතුරාජවෙල, කහටමැද වෙල්යාය නම් වූ ද, 1997.08.19 දින හා ගම් 2722 අංකය දරන සර්වේයර් ජනරාල්ගේ මූලික පිඹුරේ කැබලි අංක 2 යනුවෙන් නිරූපනය කර ඇත්තා වූ ද, ප්‍රමාණයෙන් හෙක්ටයාර් 162.10 වූ ද, පහත දැක්වෙන මායිම්වලින් සීමා වූ ද, මුළු රජයේ ඉඩම් ප්‍රමාණ -

| | | |
|---|---|---|
| *උතුරට* | : | අංක ගම් 2271 දරන මූලික පිඹුරේ කැබලි අංක 2 ; |
| *නැගෙනහිරට* | : | මුතුරාජවෙල වගුරු බිම යනුවෙන් හඳුන්වනු ලබන වගුරු බිම සහ අංක ගම් 2271 දරන මූලික පිඹුරේ කැබලි අංක 3 ; |
| *දකුණට* | : | අංක ගම් 2722 දරන මූලික පිඹුරේ දකුණින් පිහිටි ඇලේ උතුරු මායිමේ සිට උතුරු දෙසට මීටර් හාරසීයයක් (400ක්) පමණ වූ දුරකින් ඇලට සමාන්තරව ගමන් කරන රේඛාව ; |
| *බටහිරට* | : | අංක ගම් 2722 දරන මූලික පිඹුරේ බටහිරින් පිහිටි ඇලේ නැගෙනහිර මායිමේ සිට නැගෙනහිර දෙසට මීටර් හාරසිය තිස් පහක් (435ක්) පමණ වූ දුරකින් ඇලට සමාන්තරව ගමන් කරන රේඛාව.''. |

මෙයින් සංශෝධනය කරනු ලැබේ.

මෛත්‍රීපාල සිරිසේන,
ජනාධිපති.

2018 සැප්තැම්බර් මස 21 වැනි දින,
කොළඹ දී ය.

10 - 288

1A - PG 4245 — 1007 (2018/09) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*